# කළමනාකරණ අධ්‍යයන පීඨය
# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
## ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය



# ශිෂ්‍ය අත්පොත
## 2023

# පටුන


| | | |
|---|---|---|
| | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ගීතය | ii |
| 1. | හැඳින්වීම | 1 |
| 1.1 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 1 |
| 1.2 | කළමනාකරණ අධ්‍යයන පීඨය | 2 |
| 1.3 | ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 3 |
| 2. | උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම සහ ලියාපදිංචි කිරීම | 4 |
| 2.1 | ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් | 4 |
| 2.2 | අයදුම්පත් කැඳවීම | 4 |
| 2.3 | සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම | 5 |
| 2.4 | ලියාපදිංචි කිරීම | 5 |
| 3. | පාඨමාලා ව්‍යුහය | 6 |
| 4. | භාෂා මාධ්‍ය | 7 |
| 5. | ඇගයීම් ක්‍රමවේදය | 7 |
| 5.1 | ඇගයීම් ක්‍රමය | 7 |
| 5.2 | ඇගයීම් ශ්‍රේණිකරණය | 8 |
| 5.3 | උපාධිය පිරිනැමීමේ නිර්ණායක | 8 |
| 6. | විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම | 10 |
| 6.1 | විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම | 10 |
| 6.2 | පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර | 10 |
| 6.3 | විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස් | 10 |
| 6.4 | විභාග අක්‍රමිකතා | 11 |
| 6.5 | විභාග අක්‍රමිකතා සඳහා දඬුවම් | 11 |
| 6.6 | විභාග ප්‍රතිඵල නිකුත් කිරීම | 11 |
| 7. | උපාධි සහතික සහ උපාධි ප්‍රදානෝත්සවය | 11 |
| 7.1 | ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය | 12 |

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ගීතය**

ප්‍රඥා ලෝකය දැල් වූ
ජය සංකේතය මිහින්තලේ
චොරඬේ චොරඬේ ශ්‍රී ලංකා
රජරට විශ්ව විද්‍යාලය සැරදේ………//

උරුමය සැකසිය හැදියාවයි
මතුකළ සම්මා දර්ශනයයි
ශිල්ප ශාස්ත්‍ර නිකේතනයයි
බුද්ධිය ශක්තිය ප්‍රබෝධයයි….

ප්‍රඥා ලෝකය දැල් වූ….

දැනුම නුවණ දේශය වෙනුවෙන්
නංවමු සුජීවනය වඩමින්
විද්‍යා ඥාන ගවේෂණයයි
මානවවාදී විවරණයයි….

ප්‍රඥා ලෝකය දැල් වූ….

**XX**

# 1. හැඳින්වීම

## 1.1 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සමාජ සංවර්ධනයේ ආරම්භය සනිටුහන් කරන ඓතිහාසික නගරයක් වන වර්තමාන ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ වඩාත් කැපී පෙනෙන මධ්‍යස්ථානයක් ලෙස සැළකෙන මිහින්තලේ නගරය තුළ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පිහිටා ඇත. එය පිහිටා ඇත්තේ අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ පූජනීය නගරයක් වන අනුරාධපුර නගරයේ සිට කිලෝමීටර් 14ක් දුරිනි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය යටතේ අංක 896/2 දරණ ගැසට් නිවේදනය මගින් අනුබද්ධ විශ්වවිද්‍යාල ඒකාබද්ධ කොට ජාතික විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 1995 නොවැම්බර් මස 07 වන දින ශ්‍රී ලංකාවේ එකොළොස්වන ජාතික විශ්වවිද්‍යාලය ලෙස ආරම්භ කරන ලදි.

ආරම්භයේ දී සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, කෘෂිකර්ම පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ හතරකින් ආරම්භ කරන ලද අතර 2006 වර්ෂයේ දී වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයත් 2017 වර්ෂයේදී තාක්ෂණික පීඨයත් මෙම විශ්වවිද්‍යාලයේ පස්වන හා හයවන පීඨ ලෙස ස්ථාපිත කරන ලදි. කෘෂිකර්ම පීඨය පුලියන්කුලම පරිශ්‍රය තුලත් වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සාලියපුර පරිශ්‍රය තුලත් ස්ථාපිත කොට ඇති අතර අනෙකුත් සියළු පීඨ මිහින්තලේ පරිශ්‍රයේ ස්ථාපිතව ඇත. ඒ අනුව වර්තමානය වන විට රජරට විශ්වවිද්‍යාලය පීඨ හයකින් (6) සමන්විත වේ. වර්තමානය වන විට විශ්වවිද්‍යාලය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් බර්ගර් ඇතුළු සියළු ශ්‍රී ලාංකික ජාතීන්ගෙන් මෙන්ම (විදේශිකයන්ගෙන්ද) සමන්විත වූ විද්‍යාර්ථයින් හත්දහස් පන්සියකට අධික සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතු වල නිරතව සිටී.

### 1.1.1 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය දැක්ම

"උසස් අධ්‍යාපනය, පර්.යේෂණ සහ දැනුම ලබාදීමේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම"

### 1.1.2 ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයීය මෙහෙවර

"නිර්මාණශීලීත්වය සහ විනය සහිත උසස් තත්වයේ නවෝත්පාදනයන්ගෙන් පරිපූර්ණ බුද්ධිමතුන් බිහිකිරීම, කාර්ය මණ්ඩලයේ නිපුණතා සහ කැපවීම වර්ධනය කිරීම, ඉගැන්වීම, ඉගෙනීම, පර්යේෂණ සහ දැනුම බෙදා හැරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සහ අන්‍යෝන්‍ය ගෞරවය රැකෙන පරිදි සදාචාරාත්මක හැසිරීම් වර්ධනය තුළින් සහජීවනය වර්ධනය කිරීම"

### 1.1.3 විශ්වවිද්‍යාලයීය නිලධාරීන්

කුලපති - ආචාර්ය ඊතල වැටුනු වැවේ ඥාණතිලක හිමි

උප කුලපති - මහාචාර්ය සංජීවනි ගිනිගද්දර

xx

පීඨාධිපතිවරුන්

01. කළමනාකරණ අධ්‍යයන පීඨය - මහාචාර්ය පි.එම්.බී ජයතිලක
02. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය - මහාචාර්ය තුසිත මෙන්ඩිස්
03. කෘෂිකර්ම පීඨය - මහාචාර්ය ජී.බී.ටී.වී වීරසූරිය
04. ව්‍යවහාරික විද්‍යා පීඨය - මහාචාර්ය රංජිත් එදිරිසිංහ
05. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය - ආචාර්ය ජනක පුෂ්පකුමාර
06. තාක්ෂණික පීඨය - ආචාර්ය ටී.සී බමුණුආරච්චිගේ

01. ලේඛකාධිකාරී - ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා
02. මූල්‍යාධිකාරී (වැ.බ)- එස්.එස්.කේ ගොඩකුඹුර මහතා
03. පුස්තකාලයාධිකාරී - ඒ.වී. සිරිවර්ධන මහත්මිය - (වැ.බ) ඩබ්.පී.ටී දිල්රුක්ෂි

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය**

අධ්‍යක්ෂ - මහාචාර්ය ඩබ්.පී විජේවර්ධන

නියෝජ්‍ය අධ්‍යක්ෂ (විභාග) - මහාචාර්ය ජේ. ගුණරත්න

නියෝජ්‍ය ලේඛකාධිකාරී - ඒන්.සී.එස් සේනක මහතා

සහකාර මූල්‍යාධිකාරී - එම්.ජී.එල් මාවිකුඹුර මහතා

**ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි අංශය**

| | |
|---|---|
| I වන වසර සම්බන්ධීකාරක | ආචාර්ය ජේ.එස් කුමාරි |
| II වන වසර සම්බන්ධීකාරක | කේ.ටී.එල්.යූ.එස් දයාන්ගන මහතා |
| III වන වසර සම්බන්ධීකාරක | එච්.කේ.ජී.එම්.එන් කරුණාරත්න මහතා |
| ශිෂ්‍ය කටයුතු සම්බන්ධීකාරක | ආචාර්ය ජේ.කේ මල්ලිකා |

SAR???

## 1.2 කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයන පීඨය 1995 දී ආරම්භ කරන ලද අතර වර්තමානය වන විට කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කරමින් සිටී. මේ වන විට මෙම පීඨය ගණකාධිකරණ හා මූල්‍ය, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු පද්ධති, අළෙවි

කළමනාකරණය සහ සංචාරක හා සත්කාරක කළමනාකරණ සේවා ලෙස දෙපාර්තමේන්තු හයකින් (06) සමන්විත වේ. වර්තමානය වන විට අභ්‍යන්තර හා බාහිර උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් හයදහසකට (6000) අධික සංඛ්‍යාවක් සහ පශ්චාත් උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් එක් දහස් පන්සියයක් (1,500) පමණ අධ්‍යයන කටයුතු වල නිරතව සිටී. 1995 සිට පීඨය මගින් බිහිකළ උපාධිධාරීන්ගෙන් බහුතරයක් මේ වන විට දේශීය රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හී මෙන්ම, විදේශීයව ද වගකිව යුතු තනතුරු දරමින් කටයුතු කරමින් සිටී.

### 1.2.1 කළමනාකරණ අධ්‍යයන පීඨයේ මෙහෙවර

"කළමනාකරණය සහ ප්‍රායෝගික කුසලතා සපිරි නායකත්වයක් සඳහා අවශ්‍ය ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සහ වෙනස්වන පරිසරය පිළිබඳව නිසි සැළකිල්ලක් දක්වමින් පර්යේෂණයන් පැවැත්වීම"

### 1.2.2 කළමනාකරණ අධ්‍යයන පීඨයේ අරමුණු

- ව්‍යාපාර සංවර්ධනය, ඒ සඳහා සහාය වීම සඳහා අවශ්‍ය ව්‍යාපාරික සහ කළමනාකරණ අධ්‍යාපනය ලබා දීම.
- ව්‍යාපාරික ව්‍යවසායන් සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම සහ වේගයෙන් සංවර්ධනය වන ව්‍යාපාරික පරිසරය තුළ වෘත්තිකයන් වීමට ඔවුන්ට අවස්ථාව ලබා දීම.
- ව්‍යාපාරික ලෝකයේ ඇති ගැටළු අවබෝධ කර ගැනීමට, ඒවා විසඳීමට සහ සිසුන්ගේ අනාගත වෘත්තීන් සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබාදීම.
- සිසුන්ගේ නිශ්චිත වූ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ නිර්මාණාත්මකව චින්තනය ගැටළු විසඳීම, සන්නිවේදනය සහ පර්යේෂණ කුසලතා පිළිබඳ පූර්ණ හැකියාවන් ලඟා කර ගැනීමට සිසුන් දිරිමත් කිරීම.

### 1.2.3 පීඨය මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලා

<u>අභ්‍යන්තර උපාධි පාඨමාලා</u>

- විද්‍යාවේදී ගණකාධිකරණ හා මූල්‍ය (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී සංචාරක හා සත්කාරක කළමනාකරණ (ගෞරව) උපාධිය

බාහිර උපාධි පාඨමාලා

- ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

පශ්චාත් උපාධි පාඨමාලාවන්

- ව්‍යාපාර පරිපාලනපති උපාධි පාඨමාලාව (MBA)
- ආචාර්ය උපාධිය (PhD)

## 1.3 ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් 2013 වර්ෂයේදී මෙම බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදි. මෙම උපාධි පාඨමාලාව හඳුන්වාදීමේ පරමාර්ථය වන්නේ උසස් අධ්‍යාපනය හැදෑරීමට කැමති අවශ්‍ය සුදුසුකම් සහිත ඕනෑම කෙනෙකුට ඒ සඳහා අවස්ථාව ලබා දීමත්, ශ්‍රම බලකායේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා අවස්ථාව ලබා දීමත්ය. මේ තුලින් මානව සම්පතෙහි හැකියාව, කුසලතා, හැසිරීම් රටාවන් වෙනස් කිරීමට හේතුවන අතර සංවිධානවල කාර්යක්ෂමතාවය, සඵලදායිතාවය සහ ඵලදායිතාවය වැඩි කිරීමට හේතුවනු ඇත. එමෙන්ම පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට බලාපොරොත්තු වේ.

- කළමනාකරණ ක්ෂේත්‍රයේ වැඩිදුර අධ්‍යනය සඳහා අවස්ථා සැළසීම.
- කළමනාකරුවන්ට කළමනාකරණ හැකියාවන් පිළිබඳව දැන හඳුනා ගැනීමට අවස්ථාව සැළසිම.
- විභව ධාරිතාවයන් ගවේෂණය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය සහතික කිරීම
- වැඩි ඵලදායිතාවයන් සහතික කරමින් ආයතනික සැළසුම් තුළ ගැටළු හඳුනාගෙන ඵලදායි ලෙස විසඳීමට අවශ්‍ය දානුම, කුසලතා සහ ආකල්ප වලින් කලමනාකරුවන් සන්නද්ධ කීරිම.
- ආයතනික හා සමාජීය වර්ධනය සහ සංවර්ධනය සහතික කරමින් සමාජ වටිනාකම්, ආයතනික සමාජ වගකීම් සහ ඒ අනුව ක්‍රියා කිරීමට අවස්ථාව සැලසිම.

වර්තමානය වන විට සිසුන් 4,633 ක් පමණ බාහිර උපාධී අපේක්ෂකයින් වශයෙන් ලියාපදිංචි වී තම අධ්‍යයන කටයුතු පවත්වාගෙන යනු ලබන අතර සිසුන්ගේ පහසුව සඳහා වර්තමානය වන විට අනුරාධපුර, කුරුණෑගල මහනුවර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි අධ්‍යයන මධ්‍යස්ථාන තුළ සති අන්තයේ දේශන සැසි පැවැත්වේ.

මෙම උපාධි පාඨමාලාවට අපේක්ෂකයන් ලියා පදිංචි කිරීමේ සිට උපාධිය පිරිනැමීම දක්වා සියලු කටයුතු අදාළ නීති රීති හා රෙගුලාසි වලට යටත්ව පවත්වාගෙන යනු ලබන්නේ රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය මඟිනි. එසේ වුවද, මෙම උපාධි පාඨමාලාවට අදාළ සියලු නිර්දේශ ව්‍යාපාර

පරිපාලන උපාධියට අදාල අධ්‍යයන මණ්ඩලය (Board of Study), කළමනාකරණ අධ්‍යයන පීඨ සභාව (Faculty Board) විසින් බාහිර විභාග කමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබීමෙන් පමණක් ක්‍රියාත්මක කරනු ලබයි.

### 1.3.1 පාඨමාලා ඒකක (මොඩියුල)

මෙම උපාධි පාඨමාලාව හදාරන සියලු උපාධි අපේක්ෂකයින්ට එක් එක් පාඨමාලා විෂය ඒකකය සඳහා විෂය කරුණු ආවරණය කිරීමට ප්‍රමාණවත් පරිදි සකස් කරන ලද පොතක්/ මොඩියුලයක් (Course Module) ලබා දීමට කටයුතු කර ඇත.

## 2. උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම සහ ලියාපදිංචි කිරීම

### 2.1 ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්

මූලික වශයෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගයේ කාර්ය සාධනය මත පදනම්ව සිසුන් තෝරා ගනු ලැබේ. මෙහිදී අපේක්ෂකයින් ඕනෑම විෂය ධාරාවකින් උසස් පෙළ විභාගය එකවර විෂයන් තුනම සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය.

පාඨමාලාව සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ.

- අ:පො:ස(උසස් පෙළ) සම්පූර්ණ කිරීම

  හෝ

- NVQ මට්ටම 4 හෝ ඊට සමාණ කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබා තිබීම

  හෝ

- සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් ඕනෑම සුදුසුකමක්.

### 2.2 අයදුම්පත් කැඳවීම

මෙම උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම පුවත් පත් දැන්වීම් මගින් සහ අන්තර්ජාලය මගින් සිදු කරනු ලැබේ. ලියාපදිංචිය සඳහා අවශ්‍ය අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන cdce.rjt.ac.lk/cdce තුළින් බාගත කරගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය ලියකියවිලි සමග **" ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

පහත සඳහන් හේතූන් එකක් හෝ කිහිපයක් හේතු කොටගෙන ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

i. නිසි අයදුම් පත්‍රයක් නොමැතිව ඉදිරිපත් කිරීම.
ii. අදාළ සියළු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම.
iii. අදාළ ගාස්තු නිසි පරිදි ගෙවා නොතිබීම.
iv. ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබීම.
v. සඳහන් කර ඇති තොරතුරු සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම.
vi. නියමිත දිනට පසු අයදුම්පත් ඉදිරිපත් කිරීම.

### 2.3 ලිඛිත හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම

ලියාපදිංචිය සඳහා සුදුසුකම් සපුරා ඇති සිසුන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙහිදී ඔහු හෝ ඇය විසින් අවශ්‍ය සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රමාණය මත ලිඛිත පරීක්ෂණයකට වුවද අයදුම්කරුවන්ට පෙනී සිටීමට සිදුවේ.

- යෝග්‍යතා පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව සිසුන් තෝරා ගනු ලැබේ.

### 2.4 ලියාපදිංචි කිරීම

තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) සහ පීඨ මණ්ඩලයේ නිර්දේශයන්ට අනුකූලව සනාතන සභාවේ අනුමැතියට යටත්ව ලියාපදිංචි කරනු ලැබේ. පළමුව එක් අධ්‍යයන වර්ෂයක් සඳහා ලියාපදිංචි විය යුතුය. ඉන් පසු සෑම අධ්‍යයන වර්ෂයක් සඳහාම අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී ලියාපදිංචිය අළුත් කළ යුතුය. මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට ලබා දෙන උපරිම කාලය වසර 06කි. වසර 06ක් ඉක්මවූ පසු උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වේ නම් ඔවුන්ගේ ලියාපදිංචිය අහෝසි වන අතර ඒ පිලිබඳ අවසන් තීරණය සනාතන සභාව සතුවේ. ලියාපදිංචි වූ පසුව සෑම උපාධි අපේක්ෂකයෙකු සඳහාම ලියාපදිංචි අංකයක් සහ ශිෂ්‍ය වාර්තා පොතක් නිකුත් කරනු ලැබේ.

#### 2.4.1 අධ්‍යයනාරම්භය කල් දැමීම (Deferment)

උපාධි පාඨමාලාවේ අධ්‍යයනාරම්භය කල් දමා ගැනීම වෛද්‍ය හේතු මත හෝ වෙනත් වෛද්‍ය නොවන සාධාරණ හේතු මත සිදු කළ හැකිය. එවැනි ඉල්ලීමක් ශිෂ්‍යයා විසින් හෝ ඔහුගේ භාරකරුවන් විසින් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත පළමු වසර පළමු වර්ෂාර්ධ විභාගය ආරම්භ වීමට පෙර සාක්ෂි සමග ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. වසරකට වරක් බැගින් උපරිම වසර දෙකක් දක්වා කල් ලබා දිය හැකිය. මෙසේ ලබා ගත් දිගුව උපාධිය සම්පූර්ණ කිරීමට ලැබෙන උපරිම කාලයෙන් අඩු නොකරනු ලැබේ.

එක් එක් ශිෂ්‍යයාගේ ඉල්ලීම් සම්බන්ධ සනාථන සභාවේ අවසාන තීරණය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

පළමු වසර පළමු වර්ෂාර්ධ විභාගය ආරම්භ කිරීමට පෙර අධ්‍යනාරම්භය කල් දමා ගැනීමට ඉල්ලීමක් නොකළ සහ පළමු වසර පළමු වර්ෂාර්ධ විභාගයට අයදුම් නොකළ සිසුන් උපාධි පාඨමාලාව අතහැර ගිය අය ලෙස සළකනු ලැබේ. එබඳු සිසුන්ගේ ලියාපදිංචිය අවලංගු කළ බව ඝොෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් වහා ශිෂ්‍යයාට දැනුම් දෙනු ලබයි. මෙහිදී ශිෂ්‍යයා විසින් ගෙවන ලද ගාස්තු නැවත ගෙවනු නොලැබේ.

### 2.4.2 ලියාපදිංචිය අවලංගු කිරීම.

ලියාපදිංචිය අවශ්‍යතාව පරිදි දීර්ඝ කර ගැනීමට කටයුතු නොකරන අපේක්ෂකයින්ගේ ලියාපදිංචිය ස්වයංක්‍රීයව අවලංගු වේ.

ලියාපදිංචි උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී තම ලියාපදිංචිය අවලංගු කර ගත හැකිය. එවැනි අවස්ථාවක දී අදාළ ගාස්තු ලබා දීමක් සිදු නොකරයි. එසේ වුවත් පහත සඳහන් අවස්ථාවන් වල දී අපේක්ෂකයින්ට ලියාපදිංචිය අවලංගු කිරීමට ඉල්ලීම් කළ නොහැක.

අ) පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අපේක්ෂයින්

ආ) විභාග අක්‍රමිකතා සම්බන්ධයෙන් විනයානුකුල ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිතව ඇති අපේක්ෂකයින්

### 2.4.3 නොපැමිණීමේ අවසරය / නිවාඩු ලබා ගැනීම (Leave of Absence)

යම් උපාධි අපේක්ෂකයෙකු පළමු වසර සඳහා ලියාපදිංචි වී පළමු වර්ෂාර්ධ පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමෙන් පසුව වෛද්‍ය හේතු, වෛද්‍ය නොවන හේතු හෝ මෙම හේතු දෙකම මත උපාධි පාඨමලාවෙන් නිවාඩු ලබා ගැනීම සඳහා ලිඛිත සාක්ෂි සමඟ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරි වෙත ඉල්ලීමක් කළ හැකිය. මෙහිදී ඉතාමත් සාධාරණ හේතු මත කරන ඉල්ලීම් වෙන් වෙන් වශයෙන් ගෙන පීඨ මණ්ඩලයේ නිර්දේශය සහ සනාතන සභාවේ අනුමැතිය මත ලබා දෙනු ලැබේ. මෙම නිවාඩු ලබා දීම එක් වරකට එක් අර්ධ වර්ෂිකය බැගින් උපරිමය අර්ධ වර්ෂිකය දෙකක් දක්වා ලබා දීම සිදු කරයි. වෛද්‍ය හේතු මත ප්‍රදානය කරන නිවාඩු කාලය උපාධිය සම්පූර්ණ කිරීමට ලැබෙන උපරිම කාලයෙන් අඩු කරනු නොලැබේ. වෛද්‍ය නොවන හේතු මත නිවාඩු ප්‍රදානය කරන විට පංති සාමාර්ථයක් සඳහා හිමිකම, උපාධිය සම්පූර්ණ කිරීමට ලැබෙන උපරිම කාලයෙන් නිවාඩු කාලය අඩු කරනවාද නැද්ද යන්න පීඨ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. තීරණය කුමක් වුවද ලේඛකාධිකාරී විසින් වහාම උපාධි අපේක්ෂකයින්ට දන්වනු ලැබේ.

## 3. පාඨමාලා ව්‍යුහය

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (සාමාන්‍ය) බාහිර උපාධිය වසර තුනක උපාධි පාඨමාලාවක් වන අතර වර්ෂාර්ධ (Semester) 06කින් සමන්විත වේ. එමෙන්ම පාඨමාලා ඒකක (Course units) 28කින් සමන්විත වන මෙම උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්මාන (Credits) 92 ක් සම්පූර්ණ කළ යුතුය.

සෑම පාඨමාලා ඒකකයක් සඳහාම පාඨමාලා ඒකක අංකයක් (Course Code) ලබා දී ඇත. එය පහත පරිදි අර්ථකථනය කළ හැකිය.

උදා - BBA 1113

BBA – ව්‍යාපාර පරිපාලනවේ දී (සාමාන්‍ය) උපාධිය (Bachelor of Business Administration)

**පළමු අංකය** - උපාධි පාඨමාලාවේ වර්ෂය

1 - පළමු වසර

2 - දෙවන වසර

3 - තෙවන වසර

**දෙවන අංකය** - උපාධි පාඨමාලාවේ එක් එක් වසරෙහි වර්ෂාර්ධය (Semester)

1 - පළමු වර්ෂාර්ධ

2 - දෙවන වර්ෂාර්ධ ය

**තෙවන අංකය** - එක් එක් වර්ෂාර්ධයේ එක් එක් පාඨමාලා ඒකකය සඳහා හිමි අංකය

**සිව්වන අංකය** - එක් එක් පාඨමාලා ඒකකය සඳහා අධ්‍යයන සම්මාන (Credits) ප්‍රමාණය

**පාඨමාලා සංයුතිය**

| වර්ෂය | වර්ෂාර්ධය | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකය |
|---|---|---|---|
| 1 | I | BBA 1114 | කළමනාකරණ මූලධර්ම |
| | | BBA 1123 | සූක්ෂම ආර්ථික විද්‍යාව |
| | | BBA 1133 | මූල්‍ය ගිණුම්කරණය I |
| | | BBA 1143 | ව්‍යාපාර ගණිතය |
| | | BBA 1153 | තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය |
| | I I | BBA 1213 | සංවිධාන චර්යාව |
| | | BBA 1223 | සූක්ෂම ආර්ථික විද්‍යාව |
| | | BBA 1233 | මූල්‍ය ගිණුම්කරණය II |
| | | BBA 1243 | ව්‍යාපාර සංඛ්‍යානය |
| | | BBA 1252 | ව්‍යාපාර ඉංග්‍රීසි |
| 2 | I | BBA 2113 | අළෙවි කළමණාකරණය |
| | | BBA 2123 | කළමනාකරණ ආර්ථික විද්‍යාව |
| | | BBA 2133 | පිරිවැය ගිණුම්කරණය |
| | | BBA 2143 | කළමනාකරණ විද්‍යාව |

| | | | |
|---|---|---|---|
| | | BBA 2153 | ව්‍යාපාර සන්නිවේදනය |
| | I I | BBA 2214 | මානව සම්පත් කළමණාකරණය |
| | | BBA 2223 | මෙහෙයුම් කළමණාකරණය |
| | | BBA 2233 | කළමනාකරණ ගිණුම්කරණය |
| | | BBA 2244 | විගණනය හා බදුකරණය |
| | | BBA 2253 | කළමණාකරණ තොරතුරු පද්ධති |
| 3 | I | BBA 3114 | ව්‍යාපෘති කළමණාකරණය |
| | | BBA 3124 | ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර කළමනාකරණය |
| | | BBA 3134 | ජාත්‍යන්තර ව්‍යාපාර කළමණාකරණය |
| | | BBA 3143 | ව්‍යාපාර නීතිය |
| | I I | BBA 3214 | උපාය මාර්ගික කළමනාකරණය |
| | | BBA 3224 | මූල්‍ය කළමනාකරණය |
| | | BBA 3234 | පර්යේෂණ ක්‍රමවේදය |
| | | BBA 3243 | ව්‍යාපාරික ආචාර ධර්ම සහ සමාජ වගකීම |

## 4. භාෂා මාධ්‍ය

බාහිර උපාධියට අදාළ සියලු දේශන සහ පරීක්ෂණ දැනට සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත් වීමට කටයුතු කර ඇත.

## 5. ඇගයීම් ක්‍රමවේදය

### 5.1 ඇගයීම් ක්‍රමය

උපාධි අපේක්ෂකයින් පහත පරිදි ඇගයීමට ලක් කරනු ලබයි.

01. අඛණ්ඩ ඇගයීම් (Continuous Assessment) - 30%
02. අවසන් අර්ධ වාර්ෂික පරීක්ෂණය (End Semester Examination) - 70%

### 5.1.1 අඛණ්ඩ ඇගයීම්

පාඨමාලා ඒකක සඳහා අඛණ්ඩ ඇගයීම් අදාළ විෂයෙහි දේශකවරයා විසින් තීරණය කරනු ලබයි. මෙය අවම වශයෙන් පැවරුම් දෙකකින් සමන්විත වේ. අදාළ පඨමාලා ඒකකයට අදාළ ඇගයීමේ ක්‍රමය සහ ඇගයීම් සිදු කරන ආකාරය වර්ෂාර්ධය ආරම්භයේදීම සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

මෙය විභාගයේම කොටසක් මෙන්ම එක් එක් උපාධි අපේක්ෂකයා විසින් ඒ ඒ විෂයට අදාළ අඛණ්ඩ ඇගයීම් සඳහා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය එම විෂයයන් සමත් වීමට හෝ ඉහළ ශ්‍රේණියක් වෙත යැමට දැඩි බලපෑමක් සිදු කරයි.

***වැදගත් :-*** *සියළුම උපාධි අපේක්ෂකයින් අඛණ්ඩ ඇගයීම් වලට අදාළ පැවරුම් සිදු කිරීමේ දී ඉතාමත් ස්වාධීනව, දැඩි කැපවීමකින්, අවංකව ඉටු කිරීම බලාපොරොත්තු වන අතර වෙනත් පැවරුම් වලින්, වෙනත් ස්ථාන වලින් ඍජු ලෙස උපුටා ගැනීම, කොපි කිරීම් හෝ වෙනත් වංචා සහගත ක්‍රියා සිදුකර ඇත්නම් පැවරුම් සඳහා ලකුණු ලබා නොදීම මෙන්ම විභාග අක්‍රමිකතා යටතේ දඬුවම් ලබා දීම සිදුවන බව තරයේ සිතේ තබා ගන්න. එමෙන්ම නියමිත දිනට පසුව ලැබෙන පැවරුම් කිසිම හේතුවක් නිසා බාරගනු නොලැබේ.*

### 5.1.2 අවසන් අර්ධ වාර්ෂික පරීක්ෂණය

අවසන් අර්ධ වාර්ෂික පරීක්ෂණ එක් එක් අර්ධ වාර්ෂය අවසානයේ දී සිදු කරයි.

## 5.2 ඇගයීම් ශ්‍රේණිකරණය (Grading System)

2008 නොවැම්බර් 25 දිනැති කොමිෂන් චක්‍ර ලේඛ අංක 901ට සමගාමීව පහත දැක්වෙන කාණ්ඩ දොළහකට අනුව ලකුණු ශ්‍රේණිගත කරනු ලැබේ.

| ලකුණු පරාසය<br>Range of Marks | ශ්‍රේණිය<br>Grade | ලක්ෂ්‍ය අගය<br>Point Value |
|---|---|---|
| 85 – 100 | A+ | 4.00 |
| 75 – 84 | A | 4.00 |
| 70 – 74 | A- | 3.70 |
| 65 – 69 | B+ | 3.30 |
| 60 – 64 | B | 3.00 |
| 55 – 59 | B- | 2.70 |
| 50 – 54 | C+ | 2.30 |
| 40 – 49 | C | 2.00 |

| | | |
|---|---|---|
| 35 – 39 | C- | 1.70 |
| 30 – 34 | D+ | 1.30 |
| 25 – 29 | D | 1.00 |
| 00 – 24 | E | 0.00 |

**5.2.1ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය ගණනය කිරීම Calculation of Grade Point Average (GPA)**

i.e $GPA = \frac{\sum C_i P_i}{\sum C_i}$

C$i$ යනු i පාඨමාලා ඒකකයේ සම්මාන අගය වන අතර P$i$ යනු එම ඒකකයේ සිසුන්ගේ කාර්ය සාධනයට අනුරූප වන ලක්ෂ්‍ය අගයයි (*$C_i$ is the credit value of the $i^{th}$ course unit and $P_i$ is point value corresponding to the students' performance in that unit).*

*GPA ගණනය කිරීම: උදාහරණයක්*

*පිළිවෙලින් 3 සහ 4 සම්මාන අගයන් ඇති X සහ Y පාඨමාලා 2 සලකා බලන්න. ශිෂ්‍යයෙකු X සඳහා "B+" ශ්‍රේණියක් සහ Y සඳහා "A-" ශ්‍රේණියක් ලබා ගන්නේ නම්, ඔහුගේ/ඇයගේ GPA පහත දැක්වෙන පරිදි ගණනය කෙරේ.*

$$GPA = \frac{3(\text{සම්මාන අගය}) \times 3.30(GPA) + 4(\text{සම්මාන අගය}) \times 3.70(GPA)}{7(\text{මුළු සම්මාන ගණන})} = 3.52$$

**5.3 උපාධිය පිරිනැමීමේ නිර්ණායක**

ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සම්පූර්ණ කිරීම සඳහා උපාධි අපේක්ෂකයෙකු විසින් පහත අවශ්‍යතාවන් සම්පූර්ණ කළ යුතුය.

5.3.1 සාමාන්‍ය සාමාර්ථ්‍යය (General Pass)

අ) සෑම අර්ධ වාර්ෂිකයක් සඳහාම අවමය 2.00ක GPA අගයක් ලබාගත යුතු අතර සමස්ථ උපාධි පාඨමාලාව සඳහා අවමය 2.00ක GPA අගයක් ලබා ගත යුතුය.

ආ) සමස්ථ උපාධි පාඨමාලාව තුළ E ශ්‍රේණියක් නොතිබිය යුතුය.

ඇ) එක් අර්ධ වර්ෂයක් සඳහා D, D+ හෝ C- එකකට වඩා නොතිබිය යුතු අතර සමස්ථ උපාධි පාඨමාලාව තුළ තබාගත හැක්කේ D, D+ හෝ C- උපරිම 4කි.

ඇ) ඉහත අ) සිට ඇ) දක්වා සියලු අවශ්‍යතාවන් උපරිම අධ්‍යයන වර්ෂ 6ක් තුළ සම්පූර්ණ කර තිබිය යුතුය.

**5.3.2 පන්ති සාමාර්ථයක් ප්‍රදානය කිරීම.**

මෙම උපාධි පාඨමාලාවට අදාළව පැවැත්වෙන පරීක්ෂණ වලදී අදාළ නිර්ණායක වලට අනුකූලව සියලු අවශ්‍යතා සම්පූර්ණ කරමින් විශේෂ කුසලතාවයන් දක්වා ඇති අපේක්ෂකයන් වෙත පන්ති සාමාර්ථයන් පිරිනැමීම සඳහා සලකා බලනු ලැබේ.

**<u>5.3.2.1 ප්‍රථම පන්ති සාමාර්ථය (First Class)</u>**

අ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.70 කට නොඅඩු GPA අගයක් ලබාගත යුතුය.

ආ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා පවතින මුළු අධ්‍යයන සම්මාන (Credit) සංඛ්‍යාවෙන් භාගයක් සඳහා A- හෝ ඉහළ ශ්‍රේණීන් ලබා ගෙන තිබිය යුතුය.

ඇ) සමස්ත උපාධි පාඨමාලාවෙහි කිසියම් හෝ පාඨමාලා ඒකකයක් සඳහා C වලට වඩා පහළ ශ්‍රේණියක් ලබාගෙන නොතිබිය යුතුය.

ඇ) මෙම සියළු අවශ්‍යතාවන් ඒ ඒ පරීක්ෂණය සඳහා පෙනී සිටින පළමු ප්‍රයත්නයේදීම සම්පූර්ණ කර තිබිය යුතුය.

**<u>5.3.2.1 දෙවන පෙළ (ඉහළ) සාමාර්ථය (Second Class Upper Division)</u>**

අ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.30 කට නොඅඩු GPA අගයක් ලබා ගත යුතුය.

ආ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා පවතින මුළු අධ්‍යයන සම්මාන සංඛ්‍යාවෙන් භාගයක් සඳහා B+ හෝ ඉහළ ශ්‍රේණීන් ලබා ගෙන තිබිය යුතුය.

ඇ) සමස්ත උපාධි පාඨමාලාවෙහි කිසියම් හෝ පාඨමාලා ඒකකයක් සඳහා C සාමාර්ථයට වඩා පහළ ශ්‍රේණීන් ලබාගෙන නොතිබිය යුතු අතර එක් පාඨමාලා ඒකකයක් සඳහා පමණක් ලබාගත් D, D+ හෝ C- ශ්‍රේණියක් නැවත එම පාඨමාලා ඒකකයට පෙනී සිට C ශ්‍රේණියක් බවට පත්කර ගත හැක.

ඇ) පළමු ප්‍රයත්නයේදී කිසියම් හෝ පාඨමාලා ඒකකයක් සඳහා E ශ්‍රේණියක් ලබාගෙන නොතිබිය යුතුය.

ඉ) අධ්‍යයන වර්ෂ 3ක් ඇතුළත මෙම සියළු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

**<u>5.3.2.1දෙවන පන්තිය (පහළ) සාමාර්ථය (Second Class Lower Division)</u>**

අ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.00කට නොඅඩු GPA අගයක් ලබාගත යුතුය.

ආ) සමස්ත උපාධි පාඨමාලාව සඳහා පවතින මුළු අධ්‍යයන සම්භාර සංඛ්‍යාවෙන් භාගයක් සඳහා B හෝ මෙයට වඩා ඉහළ ශ්‍රේණීන් ලබා ගෙන තිබිය යුතුය.

ඇ) සමස්ත උපාධි පාඨමාලාවෙහි කිසියම් හෝ පාඨමාලා ඒකකයක් සඳහා C වලට වඩා පහළ ශ්‍රේණියක් ලබාගෙන නොතිබිය යුතු අතර පළමු ප්‍රයත්නයේදී කිසියම් හෝ පාඨමාලා ඒකකයක් සඳහා E ශ්‍රේණියක් ලබාගෙන නොතිබිය යුතුය.

ඉ) අධ්‍යයන වර්ෂ 3ක් ඇතුළත මෙම සියළු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

### 5.3.3 පොදු තොරතුරු (General Infomation)

අ) යම්කිසි සිසුවෙකු විසින් යම් පාඨමාලා ඒකකයකට C- හෝ මෙයට වඩා අඩු ශ්‍රේණියක් ලබාගෙන ඇති විට ඉදිරි පරීක්ෂණයේදී එම පාඨමාලා ඒකකයට අදාල ශ්‍රේණිය ඉහළ දමා ගත හැකිය. මෙවැනි අවස්ථාවකදී ලබාගත හැකි උපරිම ශ්‍රේණිය C වේ. නමුත් එම අවස්ථාවලදී ද කලින් ප්‍රයත්නයේදී ලබාගත් ශ්‍රේණියට අඩු ශ්‍රේණියක් ලබාගත හොත් පෙර ලබාගත් ඉහළ ශ්‍රේණිය තව දුරටත් එම පාඨමාලා ඒකකයට අදාල ශ්‍රේණිය ලෙස සලකනු ලැබේ.

ආ) යම් පාඨමාලා ඒකකයක් හෝ ඒකක අසමත් වී හෝ ඌන සාමාර්ථය ලබාගෙන ඇත්නම්, එවැනි අපේක්ෂකයෙකුට අවස්ථා තුනකදී විභාගයට පෙනී සිටිය හැක. කෙසේ වෙතත් යම් විශේෂිත අවස්ථාවන් වලදී පීඨ මණ්ඩලයේ නිර්දේශය හා සනාථන සභාවේ අනුමැතිය මත අමතර එක් අවස්ථාවක් පමණක් ලබා දීමට සලකා බලනු ලැබේ.

ඇ) යම් පාඨමාලා ඒකකයක් හෝ ඒකක අසමත් වී හෝ ඌන සාමාර්ථය ලබාගෙන නැවත අදාල පරීක්ෂණයට පෙනී සිට එම පාඨමාලා ඒකකය හෝ ඒකක සමත්වීමට ප්‍රයත්න දරණ අවස්ථාවකදී එම පාඨමාලා ඒකකයට හෝ ඒකක සඳහා ප්‍රථම අවස්ථාවේදී අඛණ්ඩ ඇගයීම් සඳහා ලබාගත් ලකුණු සංඛ්‍යාව ඉදිරියට ගෙන යනු ලැබේ.

ඈ) යම් අපේක්ෂකයෙකු යම් අර්ධ වාර්ෂිකයක් සඳහා GPA අගය 2.00 අඩුවෙන් ලබාගෙන ඇති අවස්ථාවක හෝ යම් පාඨමාලා ඒකකයක් සඳහා E ශ්‍රේණියක් ලබාගෙන ඇති අවස්ථාවක හෝ එක් අර්ධ වාර්ෂිකයක් සඳහා D, D+, C- එකකට වඩා වැඩි ගණනක් පවතින අවස්ථාවක ඔහු හෝ ඇය විසින් ඊළඟට ලැබෙන පළමු ආසන්නනතම අවස්ථාවේදීම පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.

ඉ) උපාධි පාඨමාලාවේ සියලුම පාඨමාලා ඒකක සඳහා උපාධි අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍ර පීඨ මණ්ඩලයේ නිර්දේශ මත සනාතන සභාවේ අනුමැතියට යටත්ව පත්කරන ලද පරීක්ෂකවරු දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරනු ලබයි.

ඊ) යම් අපේක්ෂකයෙකු යම් පාඨමාලා ඒකකයට අදාළ පරීක්ෂණයට රෝගාතුර වීම හේතුවෙන් පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවක ඔහු / ඇය විසින් වලංගු වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර එය පීඨ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමත වුවහොත් ඔහු හෝ ඇය නැවත එම පාඨමාලා ඒකකයට අදාළ පරීක්ෂණයට පෙනී සිටින විට ඔහු හෝ ඇයගේ එම ප්‍රයත්නය නොඉදුල් ප්‍රයත්නයක් ලෙස සළකා ඔහු හෝ ඇය ලබා ගන්නා ලකුණු වලට අදාළ ශ්‍රේණිය ලබාදෙනු ඇත.

## 6. විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

**6.1 විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම**

ලියාපදිංචි සෑම අපේක්ෂකයෙකුම උපාධි පාඨමාලාවට අදාළ වර්ෂාර්ධය පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතුය. ඒ සඳහා අයදුම්පත් කැඳවීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් සෑම පරීක්ෂණයකටම පෙර දිනකදී ප්‍රකාශයට පත් කරයි. මෙහිදී සෑම විභාග අපේක්ෂකයෙකු විසින්ම අදාළ උපදෙස් පරිදි නිසි ලෙස පුරවන ලද අයදුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

**6.2 පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර**

විභාග සඳහා අයදුම් කළ ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියළු අපේක්ෂකයින්ට සෑම පරීක්ෂණයක්ම ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර පරීක්ෂණය සඳහා අදාළ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

**6.3 විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස්**

අ) විභාග අපේක්ෂකයෙකු විභාගයක් සඳහා පෙනී සිටින සෑම අවස්ථාවකදීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය මගින් නිකුත් කරන විභාග ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ජාතික හැඳුනුම්පත තමා සන්තකයේ තබාගත යුතුය. විභාග ශාලාව තුළ ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක සිය ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට විභාග අපේක්ෂයින් බැඳී සිටී. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විභාග අපේක්ෂකත්වය වුව ද අවලංගු කිරීමට කටයුතු කළ හැක.

ආ) විභාගයට පෙනී සිටින අතරතුර ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුවහොත් වහාම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරී දැනුවත්කොට අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

ඇ) කිසියම් අපේක්ෂකයෙකු රෝගාතුර වීම නිසා කිසියම් පරීක්ෂණයකට හෝ එයින් කොටසකට පෙනී සිටීමට නොහැකි වුවහොත් ඒ සඳහා වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මෙම වෛද්‍ය සහතිකය දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකුගෙන් හෝ රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත යුතු අතර ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරියා විසින් අනුමත කළ යුතුය. සමස්ථ විභාගය සඳහා පෙනී නොසිටියේ නම් අදාල විභාගය අවසන් වන දින සිට දින 14ක් ඇතුළතද, විෂයකට හෝ විෂයන් කිහිපයකට පෙනී සිටීමට නොහැකි වූයේ නම් එම විෂය හෝ විෂයන් පැවැත් වූ දින සිට දින 14ක් ඇතුළතද වෛද්‍ය වාර්ථා ලබා දීමේ අයදුම් පත්‍රය (මෙය උපාධි පාඨමාලාවට අදාළ වෙබ් පිටුව තුළින් බාගත කර ගත හැක) සමග දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරී වෙත ලැබීමට සැළැස්විය යුතුය. මෙම කාලය ඉකුත් වීමෙන් පසුව ලැබෙන වෛද්‍ය සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇ) සියළුම විභාග අපේක්ෂකයින් අදාළ විභාග ආරම්භ කිරිමට පෙර කල්වේලා ඇතිව විභාගය සඳහා පැමිණීම බලාපොරොත්තු වේ. ඒ තුළින් අදාළ විභාග අපේක්ෂකයාටත් අනෙකුත් අපේක්ෂකයන්ටත් වන අපහසුතාවන් අවම කරගත හැක. විභාගය ආරම්භ වී මිනිත්තු 30කට පසු කිසිම අපේක්ෂකයෙකුට විභාග

ශාලාවට ඇතුලු වීමට අවසර නොමැති අතර විභාගයේ අවසන් මිනිත්තු 30 තුල කිසිම විභාග අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිට වීමට අවසර නොලැබේ.

### 6.4 විභාග අක්‍රමිකතා

- විභාගය පැවැත්වෙන අතරතුර දී සටහන් හෝ වෙනත් නීත්‍යානුකූල නොවන ලිපි ලේඛන, ජංගම දුරකතන ළඟ තබා ගැනීම හෝ භාවිතා කිරීම.
- විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙන යෑම.
- වෙනත් අපේක්ෂකයෙකු නමින් විභාගයට පෙනී සිටීම.
- කොපි කිරීම, කොපි කිරිමට උදව් කිරීම හෝ ඒ සඳහා අනුබල දීම.
- අසංවර ලෙස හැසිරීම
- වෙනත් ඕනෑම ආකාරයක වංචනික ක්‍රියා

### 6.5 විභාග අක්‍රමිකතා සඳහා දඬුවම්

- අදාළ පාඨමාලා ඒකකය සඳහා වූ අපේක්ෂකත්වය හෝ විභාග අපේක්ෂකත්වය සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම.
- ලියාපදිංචිය අත්හිටුවීම / අවලංගු කිරීම.
- වසර 03ක කාලයක් දක්වා කිසිදු විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- විශ්වවිද්‍යාල සනාථන සභාව නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවමකට යටත් කිරීම.

ඉහත සඳහන් දඬුවම් වලින් එකක් හෝ කිහිපයක් නියම කිරීමට සනාතන සභාවට හැකියාව ඇත.

### 6.6 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සනාථන සභාවේ අනුමැතියට යටත්ව එක් එක් පරීක්ෂණයන්ගේ හා සමස්ත උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ වහාම අන්තර්ජාලය මගින් විභාග ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා ඇත.

මෙයට අමතරව සනාතන සභාවේ අනුමැතිය ලැබුණු පසු දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරී ගේ අත්සනින් යුතුව සෑම සිසුවෙකුටම විස්තරාත්මකව ප්‍රතිඵල ලේඛනයක් නිකුත් කරනු ලැබේ.

## 7. උපාධි සහතික සහ උපාධි ප්‍රදානෝත්සවය

නිසි පරිදි උපාධි පාඨමාලාව සාර්ථකව අවසන් කර ඇති උපාධිධාරීන් වෙත ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයක දී තම උපාධිය පිරිනැමීමට කටයුතු සළසා ඇත.ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ විභාග සහ අධ්‍යයන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී විසින් උපාධි උත්සවය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.1 ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය අදාළ නිර්ණායක වලට යටත්ව සාර්ථකව සම්පූර්ණ කරන උපාධිධාරීන් වෙත සනාතන සභාවේ අනුමැතිය මත පහත සඳහන් ස්වර්ණ මුද්‍රිකාව පිරිනමනු ඇත.

ව්‍යාපාර පරිපාලනවේදී(සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලවේ ඉහලම කාර්ය සාධනය පෙන්නුම් කරන ශිෂ්‍යා හෝ ශිෂ්‍යාව වෙනුවෙන් පිරිනමන ආර්.කේ.ඩී.රන්දෙනි ස්වර්ණ මුද්‍රිකාව

**විමසීම්**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ
025-2266946

**උපාධි අපේක්ෂකයින්ගේ විශේෂ අවධානය පිණිසයි.**

සියළුම උපාධි අපේක්ෂකයින් මෙම ශිෂ්‍ය අත්පොත හොඳින් කියවා බලා සියළු කරුණු අවබෝධ කරගත යුතුය.

| |
|---|
| මෙම බාහිර උපාධි පාඨමාලාව සඳහා දේශන පැවැත්වීමට කිසිදු උපකාරක පන්තියකට හෝ ආයතනයකට රජරට විශ්වවිද්‍යාලය මගින් අවසර දී නොමැත. රජරට විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් විසින් පමණක් අනුරාධපුර, කුරුණෑගල, මහනුවර සහ පොළොන්නරුව යන අධ්‍යයන මධ්‍යස්ථාන වල සති අන්ත දේශන සැසි පවත්වනු ලැබේ. |

(මෙම ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් ඕනෑම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සතු වේ.)

## 8. කථිකාචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රංජිත් විජයවර්ධන
PhD (Reading), MPhil (Food Sc.) (Pera), MBA (RUSL), MSc (Food Sc.) (SJP), BSc (Agri.) (Sp.) (Pera.)

මහාචාර්ය, KGA උදය කුමාර
PhD (Xiamen, P.R. China), MCom (Kel.), PGDM (RUSL), BSc Busi. Ad. (Sp.) (SJP)

මහාචාර්ය, WP විජේවර්ධන
PhD (Xiamen, P.R. China), MBA (RUSL), BCom (Sp.) (Kel.)

මහාචාර්ය, PMB ජයතිලක
PhD (Wuhan, P.R. China), MCom (Kel.), PGDM (RUSL), BSc (Busi. Mgt) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, ALM ජමීල්
PhD (MSU, Malaysia), MCom (Kel.), PGDM (RUSL), BCom (Sp.) (Jaffna), MAAT, AIPFM (UK)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, RKD රන්දෙණි
PhD (Reading), MCom (Kel.), BA (Econ.) Sp. (Kel.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, CT ගමගේ (මහත්මිය)
PhD (MSU, Malaysia), MSc (SJP), BSc (Mgt.) (Sp.) (SJP)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, MGS පත්මිණි( මහත්මිය )
PhD (Reading), MCom (Kel.), PGDM (OUSL), BBA (Sp.)(Ruh.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, WWAN සුජීව
PhD (Reading), MCom (Kel.), PGDM (RUSL), BCom (Sp.) (SJP), CTHE (Col.), LICA

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, PG මුණසිංහ
MSc in Com. Sc. (Col.), PGD in Com. Tech. (Col.), BSc (Col.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, WMPGR පුෂ්පකුමාර
PhD (Reading), MCom (Kel.), BCom (Sp.) (Kel.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, PDNK පලිහේන
*PhD (Reading) MCom (Kel.), PGDM (RUSL), BCom (Sp.) (SJP)*

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, UWMRSSCB කප්පාගොඩ
PhD (MSU, Malaysia), MCom (Kel.), BSc Mgt. (Sp.) (SJP)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, WMRB වීරසූරිය
PhD (MSU, Malaysia), MCom (Kel.), BSc Busi. Mgt. (Sp.) (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය HMBP රණවීර
PhD (Wuhan, P.R. China), MBA (RUSL), BSc Estate Mgt. & Valuation (Sp.) (SJP)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, SNS දහනායක (මහත්මිය)
MTA (Bangalore, India), BSc (Hospitality Mgt.) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය DMC දසනායක
PhD (Waikato, New Zealand), MBA, BSc (Hospitality Mgt.) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය JK මල්ලිකා (මහත්මිය)
PhD (P.R. China), MPhil (Kel.), MA (Kel.), BA (Sp.) (SJP)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, CMYSS බණ්ඩාර (මහත්මිය)
PhD (Col.), MBA (RUSL), BSc (Busi. Mgt.) Sp. (RUSL), LLB (OUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, TMPAB තෙන්නකෝන්
PhD (Reading), MBA (RUSL), BSc (Hospitality Mgt.) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, KTNP අබේවික්‍රම මහත්මිය

MBA (RUSL), PGDTEHM (Col.), BSc (Hospitality Mgt.) (Sp.) (RUSL), CTHE (Col.), PGDC (Reading)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, TKG සමීර
PhD (Reading.), MBA (RUSL), BSc (Acc. & Fin.) Sp. (RUSL), CTHE (Col.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, RMNC ස්වර්ණපාලි (මහත්මිය)
PhD (Hust, P.R. China), MBA (RUSL), BSc (Acc. & Fin.) Sp. (RUSL), CTHE (Col.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, HKGMN කරුණාරත්න මහතා
MBA (RUSL), PGDIPAI (UoM), BSc (Busi. Info. Tech.) Sp. (RUSL), CTHE (Col.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, GPH කණ්ඩම්බි
PhD (Kel.), MBA (Kel.), BSc Mgt. & Info. Tech. (Sp.) (Kel.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, JS කුමාරි (මහත්මිය)
PhD (Col.), MBA (RUSL), BSc (Acc. & Fin.) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, KV අරුණශාන්ත
PhD (Whut, P.R. China), MSc (SJP), BSc Finance. (Sp.) (SJP), LICA

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, KTLUS දයාංගන මහතා
MSc (Food Sc. & Tech.) (SJP), BSc (Applied Sc.) (Food Sc. & Tech.) (SUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය YMWGPK උඩු රාවන
PhD (Kel.), MBA (RUSL), BBA (Marketing) Sp. (Ruh.), CBA, MSLIM, MIMSL, CTHE (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,AADP බණ්ඩාර
PhD (Reading), MBA (RUSL), BSc Acc. (Sp.) (SJP), CTHE (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, KJS මධුසංඛ
PhD *(Reading), MSc in Mgt. (SJP), BSc (Acc. සහ Fin.) Sp. (EUSL), CTHE (Kel.)*

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, PR වීරතුංග
PhD(Whut, P.R. China), MSc (Fin. Math.) (UoM), BSc (Acc. & Fin.) Sp. (RUSL), CTHE (RUSL), ICA (Final 1)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, KGP සේනානි (මහත්මිය)
MSc in Mgt. (SJP), BSc Ac. (Sp.) (SJP), ACA

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය JDT මධුසංඛ
DBA (Kel.), MBA (Kel.), BSc Mkt. (Sp.) (SJP)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්.එම්.ජී.එච්.එන් රත්නායක
PhD (Reading), MBA (Pera.), MSc Eng. (Pera.), BSc Eng (Pera.), AMIE (SL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, DMJ වික්‍රමසිංහ (මහත්මිය)
MSc in Info. Sys. Mgt. (Col.), BSc in Com. Sc. (Sp.) (Pera.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, VKN ගාමිණී
MSc in Com. Sc. (Col.), PGD in Com. Tech. (Col.), BSc Busi. Ad. (Sp.) (SJP)

කථිකාචාර්ය, PD විමලසිරි
MSc in Com. Sc. (Col.), BSc (Ruh.), CTHE (RUSL), SDDE (Japan)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, NHK කුරේ (මහත්මිය )
PhD (Reading), MSc in Mgt. (SJP), BBM in Marketing (Sp.) (Kel.)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, DMMI දිසානායක (මහත්මිය)
MSc in Mgt. (SJP), BSc (Tourism & Hospitality Mgt.) Sp. (RUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, WHMS සමරතුංග)
PhD (Sichuan Uni. of China, P.R. China), MTEHM (Col.), BSc Tourism Mgt. (Sp.) (SUSL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, EW Biyiri (මහත්මිය)

MTEHM (Col.) (Reading), BA (Sp.) in German Studies (Kel.)

කථිකාචාර්ය, TDSH දිසානායක (මහත්මිය)
*MSc in Mgt. (SJP), BBM Finance (Sp.) (Kel.), CBA (ICASL)*

කථිකාචාර්ය, HMDN සෝමතිලක (මහත්මිය)
MBA (RUSL), BSc (Acc. & Fin.) Sp. (RUSL), වරලත් අතරමැදි (CAB II) (ICASL)

කථිකාචාර්ය, HH දේදුනු (මහත්මිය)
MSc in Mgt. (SJP), BSc (Acc. & Fin.) Sp. (RUSL), Dip. Mgt හි Ac. (CIMA)

කථිකාචාර්ය DDK සුගතදාස (මහත්මිය)
MBA (RUSL), BSc (Acc. & Fin.) Sp. (RUSL), CAB II (ICASL)

කථිකාචාර්ය JMN විජේකුමාර
B.Sc., ACMA

කථිකාචාර්ය VGN සමීර
B.Sc., ACCA (Finalist), ACA (Finalist)

කථිකාචාර්ය GMHPK රත්වත්ත (මෙනවිය)
B.Sc., ACCA (Finalist), ACA (Finalist)

කථිකාචාර්ය, JAPM ජයසිංහ
MBA (Reading), BSc (Tourism & Hospitality Mgt.) Sp. (RUSL)

කථිකාචාර්ය, DDP සංජීව
MBA (Reading), BSc (Tourism & Hospitality Mgt.) Sp. (RUSL)

කථිකාචාර්ය, SMBL සුරවීර (මහත්මිය)
BSc (Busi. Mgt.) Sp. (RUSL), AAT

කථිකාචාර්ය, KMPGAJ බණ්ඩාර
BSc (Busi. Info. Tech.) Sp. (RUSL)

උපදේශක GP සුබසිංහ මහතා.
BSc (Busi. Info. Tech.) Sp. (RUSL), MBA (RUSL)

උපදේශක SAHS සුදසිංහ (මහත්මිය)
BSc Computing and Info. Sys. (Sp)(SUSL), and PG Dip. in IT (Col.)

උපදේශක GSR ගුණතුංග
BSc in Com. Sc. (Pera.), MSc. In Com. Sc. (Pera.)